මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/06/03/04/2022(45) ඔබේ අංකය / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2022.10. 03

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ හා සේවකයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2022**

උක්ත කරුණට අදාළව මා අමතන ලද දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/TR/21 හා 2022.09.28 දිනැති ලිපිය හා G/SP/3/3/TR/21 හා 2022.09.30 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව, 2022 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් මගේ අංක CSS/03/06/03/04/2022(30) හා 2022.03.16, CSS/03/06/03/04/2022(36) හා 2022.05.31 දිනැති ලිපි මගින් ලබා දී ඇති ස්ථාන මාරු නියෝග සියල්ල ක්‍රියාත්මක කරනු ලැබේ.

03. එසේ වුවද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නියමය පරිදි පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ ඉල්ලීම මත පළාත් පාලන ආයතනයක ස්ථාන මාරුවීම් ලැබ සිටින ඕනෑම සේවා ශ්‍රේණියක නිලධාරීන් 04කට නොවැඩි සංඛ්‍යාවක් අතිශය සේවා අවශ්‍යතාවයක් පවතී නම් එම නිලධාරීන්ගේ ස්ථාන මාරු 2023.03.31 දින දක්වා කල් දමනු ලැබේ. ඒ අනුව, එවැනි ස්ථාන මාරුවීම් කල් දමා ඇති නිලධාරීන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස නම් කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ද 2023.03.31 දක්වා කල් දමනු ලැබේ.

04. එසේම, අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක/ ආයතනයක ප්‍රධානියෙකු විසින් යම් නිලධාරියෙකු/ යම් නිලධාරිනියක අත්‍යාවශ්‍ය හේතු මත තාවකාලිකව රඳවා ගැනීම සඳහා මේ වන විට මා වෙත යොමු කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ද 2023.01.31 දක්වා තාවකාලිකව රඳවා ගැනීමට අවසර දෙනු ලැබේ. ඒ අනුව, එම නිලධාරීන්ගේ අනුප්‍රාප්තිකයන් ද පෙර සේවා ස්ථානයේම රැඳී සිටීමට අවස්ථාව දිය හැකිය.



CamScanner

05. ඒ අනුව, ආයතන ප්‍රධානීන් විසින් තම ආයතනයේ වාර්ෂික ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන් නිදහස් කිරීමේදී, ඉහත 03 හා 04 ඡේදයන් හි සඳහන් විධි විධාන වලට යටත් වන නිලධාරීන් අනුප්‍රාප්තික නිලධාරීන් ලෙස නම් කර ඇත්ද යන්න විමසා තහවුරු කර ගැනීමෙන් අනතුරුව සේවයෙන් නිදහස් කළ යුතුය.

06. නමුත් යම් නිලධාරියෙකු පළාත් පාලන ආයතනයක සේවය කරමින් සිට ස්ථාන මාරු කර ඇතිනම් සහ එම නිලධාරියා ස්ථාන මාරුව ලැබ ඇති සේවා ස්ථානයට සේවයට වාර්තා කිරීමට කැමැත්තේ නම් එම නිලධාරියා සේවයෙන් නිදහස්කොට නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට ඉඩ සැලසීමට පළාත් පාලන ආයතන ප්‍රධානීන් මෙන්ම අනෙකුත් ප්‍රධානීන් ද වගබලාගත යුතුය.

**07. වෙනත් ගැටළු සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) 0914946981 , සහකාර ලේකම් (පාලන) 0914946971 ඇමතිය යුතුය.**

08. එසේම, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියළුම ආයතනවල නිලධාරීන් වෙත ද මෙම ස්ථාන මාරු තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

CamScanner